**ජාතික තරුණ සේවා සභාව - 2014**

**--------------------------------------**

ජාතික තරුණ සේවා සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනතේ 29(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික තරුණ සේවා සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

ජාතික තරුණ සේවා සභාවේ පාලිත සමාගමක් වන සී/ස තරුණ සේවා සමාගමේ මූල්‍ය ප්‍රකාශන, සභාවේ මූල්‍ය ප්‍රකාශන සමග ඒකාබද්ධ කර වර්ෂයට අදාල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව පූර්ව කාලපරිච්ඡේද වැරදි, වරද සිදුවූ කාල පරිච්ඡේද සඳහා ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල සන්සන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් නිවැරදි කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල නිර්දේශ අනුව භාවිතයෙන් ඉවත් කර තිබූ ස්ථාවර වත්කම්වලට අදාලව ක්ෂය වෙන් කිරීම් වටිනාකම් වූ රු. 106,437 ක් වත්කම් ඉවත් කිරීමේ ගිණුමට ගැලපීම වෙනුවට පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද ලාභාලාභ ශේෂයට ගලපා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අඩමාණය අධි වෙන්කිරීම් රු. 168,650 ක් වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට වර්ෂයේ ඉදිරියට ගෙන එන ලද ලාභාලාභ ශේෂයට ගලපා තිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ ගිණුමට රු. 2,233,190 ක ආයෝජන කපාහැරීම් ගිණුම්ගත කිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ තථ්‍ය පාඩුව නිරූපණය නොවීය.

(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි සමාලෝචිත වර්ෂයට අදාල ජංගම නොවන වත්කම් ගැලපීම ලෙස රු. 316,620 ක ඍණ ශේෂයක් දක්වා තිබූ නමුත් එය මූල්‍ය ප්‍රකාශන අනුව රු. 301,870 ක් විය. ඒ අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් වූ මුදල් ප්‍රවාහය රු. 14,750 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ගොවිපල කාරක ගිණුම පිළියෙළ කිරීමේදී ස්ථිර බෝග ආදායම වූ රු. 1,199,508 ක් ඇතුළත් නොකර වෙනත් ආදායම් ලෙස සැලකීම නිසා ගොවිපල කාරක ගිණුම අනුව රු. 1,474,043 ක අලාභයක් පෙන්නුම් කර තිබුණි. ඒ අනුව ගොවිපල කාරක ගිණුමේ නිවැරදි මූල්‍ය ප්‍රතිඵලය නිරූපණය නොවීය.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල වූ උපචිත වියදම් රු. 93,865,651 ක් හා ගෘහස්ථ ක්‍රීඩාගාර හා නේවාසික පහසුකම් ගාස්තු වශයෙන් අයවිය යුතු රු. 363,740 ක මුදලක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(උ) විගණන නියැදි පරීක්ෂාවේදී රු. 345,013 ක් වූ සේවක ණය ශේෂයක් හඳුනාගත් නමුත් එය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්කර නොතිබුණි. කෙසේ වුවද මාසිකව රු. 5,780 බැගින් මෙම ණය අයවී ඇතත් එම මුදල විවිධ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඌ) ජාතික නිපුණතා දිනය සැමරීමේ වැඩසටහනට සමගාමීව ලංකාව පුරා තෝරාගත් පාසල් 41 ක් සඳහා අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත සභාව රු. 2,028,595 ක වැයක් දරා තිබුණද අමාත්‍යාංශය විසින් ලබාදී තිබුණේ රු. 550,000 ක් පමණි. ඒ අනුව සභාව විසින් වැයකළ රු. 1,478,595 ක මුදලක් සභාව වෙත ලබාගැනීමට කටයුතු කිරීමෙන් තොරව පලාත් කාර්යාලීය වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

### 2.2.4 අසම්භාව්‍ය බැරකම්

---------------------

ජාතික තරුණ සේවා සභාව පාර්ශවකරුවකු කර පවරා ඇති නඩු 39 ක් සම්බන්ධයෙන් ඉල්ලුම් කර ඇති වන්දි මුදල්වල එකතුව රු. 9,957,364 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

### 2.2.5 නොසැසඳුණු පාලන ගිණුම්

--------------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂය අවසානයේ ඉතිරි පාරිභෝගික බඩු තොගයේ වටිනාකම හා එදිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව බඩු තොගයේ වටිනාකම අතර රු. 21,850 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 ලැබිය යුතු ගිණුම්

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල සඳහන් එකතුව රු. 1,740,000 ක් වූ නිලධාරීන්ට ලබාදුන් ණයගැති ශේෂ 2 කින් කිසිඳු වාරිකයක් වර්ෂය තුළ අයකර නොතිබූ අතර තවත් ණයගැතියන් දෙදෙනෙකුට අයත් එකතුව රු. 552,000 ක ණය ශේෂ ක්‍රමානුකූලව අයවී නොතිබුණි.

(ආ) එකතුව රු. 648,497 ක සේවක ණය ශේෂ 06 කින් වර්ෂය තුළ කිසිඳු වාරිකයක් අයවී නොතිබූ අතර නිලධාරීන් 04 දෙනෙකුගේ රු. 153,599 ක ණය ශේෂ ක්‍රමානුකූලව අයවී නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

පහත සඳහන් නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) උපදේශකවරුන් තෝරාගැනීමේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2007 | |
| (i) 2.8 මාර්ගෝපදේශය | පුහුණු මධ්‍යස්ථාන නවීකරණය හා වැඩිදියුණු කිරීම සඳහා උපදේශකවරුන් තෝරාගැනීමේදී, ප්‍රසම්පාදන කමිටුව විසින් මාර්ගෝපදේශ පරිදි ඇතුළත් විය යුතු කරුණු ඇතුළත් වූ ප්‍රකාශයකට අත්සන් කරවාගෙන නොතිබුණි. |
| (ii) 8.8 මාර්ගෝපදේශය | තාක්ෂණික යෝජනා ඇගයීමේ ක්‍රියාපිළිවෙල අනුගමනය කර නොතිබුණි. |
| (iii) 6.2 මාර්ගෝපදේශය | මිල ගණන් ඇගයීමේ නිර්ණායකයන් පැහැදිලිව දක්වමින් මිල ගණන් කැඳවීමේ ලේඛන සකස් කර නොතිබුණි.( Request For Proposal ) ඒ අනුව මාර්ගෝපදේශ 8.8.5 ප්‍රකාරව විධිමත් ඇගයීමක් කිරීමට නොහැකිවී තිබුණි. |
| (ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 මාර්ගෝපදේශය | ගිවිසුම්ගත මුදලෙන් සියයට 10 ට වඩා විචලතාවේ අගය වැඩිනම් මුළු පිරිවැය ඇස්තමේන්තුව සංශෝධනය කළ යුතු වුවද, අනුරාධපුරය යොවුන් නිකේතනය නවීකරණයට අදාල කොන්ත්‍රාත්තුවේදී මුළු පිරිවැය ඇස්තමේන්තු සංශෝධනයකින් තොරව කොන්ත්‍රාත් පිරිවැයෙන් සියයට 40 කට වැඩි මුදලක් අතිරේක වැඩ ලෙස අනුමත කර තිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

සමාලෝචිත වර්ෂයේ ජුලි 10 දිනැති සභා තීරණ 21 / 2014 හි අංක 4.3 ට අනුව තරුණ සේවා සංගීත සමාගමේ හා තරුණ සේවා නැටුම් සමාගමේ ආයෝජනය කරන ලද රු. 2,233,190 ක ආයෝජන ශේෂය භාණ්ඩාගාර අනුමැතියකින් තොරව පොත්වලින් කපා හැර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 150.83 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. මිලියන 253.28 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 102.45 කින් වර්ධනය වී තිබූ අතර සභාවේ ආදායම රු. මිලියන 307.64 කින් වැඩි වී තිබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

සමාලෝචිත වර්ෂය සඳහා තරුණයින්ගේ සෞන්දර්යය කලා කුසලතා ඉහළ නැංවීම, වෘත්තීය සංවර්ධනය, නායකත්ව හැකියාවන් ඉහළ නැංවීම හා ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ වැඩසටහන් 6 ක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ඒ සඳහා වෙන්කළ රු. මිලියන 84.763 ක ප්‍රතිපාදන වලින් සියයට 99 ක් ඉතිරිවී තිබුණි. එමෙන්ම රු. මිලියන 13.250 ක් ප්‍රතිපාදනය කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ ශ්‍රී ලංකා යෞවන සම්මාන උළෙල අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණු අතර වෙන් කළ ප්‍රතිපාදන වලින් සියයට 70 ක් ඉතිරිවී තිබුණි.

### 4.2. කළමනාකරණ අකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුරුක්කණ්ඩි ටෙම්පල් දුම්රිය ස්ථානය ඉදිකිරීම සඳහා සභාවේ ගිණුමට එකතු කරන ලද රු.2,824,181 ක මුදලක් වර්ෂ 10 කට අධික කාලයක් අදාල කාර්යය සඳහා යොදා නොගැනීම හේතුවෙන් උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය නිසා අ.පො.ස. (සා/පෙළ) හා (උ/පෙළ) විභාගයට පෙනී සිටීමට නොහැකි වූ සිසුන් වෙනුවෙන් උපකාරක පන්ති පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය වෙත ලබාදීමට සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 02 දින රැස්වූ සභා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි. ඒ සඳහා අනුමත වියදම් ඇස්තමේන්තුව රු. 2,000,000 ක් වුවත් සභාව විසින් රු. 2,824,181 ක මුදලක් ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය වෙත ලබාදී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම මුදලින් රු. 196,800 ක් පමණක් වියදම් කර තිබුණු නමුත් ඉතිරිය වූ රු. 2,627,381 ක මුදල විගණන දිනය වූ 2015 මාර්තු 02 දින වන විටත් නැවත සභාව වෙත ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) යෞවන සමාජ වෙත තරුණ තරුණියන්ගේ නැඹුරුව වර්ධනය කිරීමේ මූලික පරමාර්ථය ඇතුළුව අරමුණු 04 ක් මත පදනම්ව තරුණ කැරැල්ල නම් වූ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂයේදී රු. 15,930,940 ක් අයවැයෙන් වෙන්කිරීමෙන් හා වෙනත් වැය විෂයයන්ගෙන් රු. 48,040,131 ක් මාරු කිරීමෙන් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. ඉන් රු. 39,798,911 ක් වැයකර තිබුණද වියදම් වාර්තා අනුව වැඩසටහනෙහි අරමුණුවලට ඍජු සබඳතාවයක් පවතින කටයුතු සඳහා වැයකර තිබුණේ සියයට 2 ක පමණ ප්‍රතිශතයකි. ඉතිරි ප්‍රතිපාදන අවස්ථානුකූල වැඩසටහන් ලෙස වැඩසටහනෙහි අරමුණුවලට අදාල නොවන වෙනත් කටයුතු සඳහා උපයෝගී කරගෙන තිබුණි.

### 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාවේ ප්‍රධාන කාර්යාලය සහ පුහුණු මධ්‍යස්ථාන 61 ක් හා ගොවිපලවල් 07 ක් පිහිටි ඉඩම් අක්කර 341 රූඩ් 27 පර්චස් 89.37 ක ඉඩම්වල අයිතිය සමාලෝචිත වර්ෂය නිම වන විටත් සභාව වෙත පවරාගැනීමට නොහැකිවී තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී එම දේපල වල ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් පමණක් රු. මිලියන 163 ක් පමණ වැයකර තිබුණි.

(ආ) ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනෙහි කාර්යසාධන ඉලක්කයන්ට අනුව රත්මලාන පුහුණු මධ්‍යස්ථානයේ සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතීතන (NVQ) 04 මට්ටමේ පාඨමාලා 10 ක් අළුතින් ආරම්භ කර සිසුන් සංඛ්‍යාව අවමය 500 ක් බඳවාගත යුතු වුවත් විගණන දිනය වූ

2015 මැයි වන විට පාඨමාලා 10 ක් ආරම්භ කර සිසුන් 254 ක් පමණක් බඳවා ගෙන තිබුණු අතර පාඨමාලා 7 ක් ප්‍රතීතනය කර නොතිබුණි.

තවද, ඉහත පාඨමාලාවන්ද ඇතුලුව පුහුණු මධ්‍යස්ථානයේ පූර්ණ කාලීන පාඨමාලා 20 ක් ද, අර්ධකාලීන පාඨමාලා 60 ක්ද පවත්වාගෙන යමින් තිබුණ අතර ඒ සඳහා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 558 ක් හා 1185 ක් විය. එම පාඨමාලා වලින් ඉතා අඩු ශිෂ්‍ය සහභාගීත්වයක් පැවති පාඨමාලා 20 ක් විය. ඉන් පාඨමාලා 10 ක සිසුන් ප්‍රමාණය 5 ට අඩුවෙන් හා අනෙක් පාඨමාලා 10 හි සිසුන් ප්‍රමාණය 5 ත් 10 ත් අතර විය.

(ඈ) රත්මලාන පුහුණු මධ්‍යස්ථානයේ මෝටර් රථ කාර්මික පාඨමාලාව හැර අනෙකුත් සියළුම පාඨමාලාවල දේශන පැවැත්වීම බාහිර උපදේශකයන්ගෙන් සිදුකළ නමුත් මෙම උපදේශකයන් බඳවාගැනීම සඳහා විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් හෝ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ඇ) ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීමට සමාලෝචිත වර්ෂය තුළ රු. 5,237,000 ක් වැයකර තිබූ නමුත් එක් එක් වර්ෂය තුළ බෙදා හරින ලද ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීමට පෙර ක්‍රීඩා භාණ්ඩ අවශ්‍යතාව තීරණය නොකිරීම හා අදාල ක්‍රීඩා සමාජ හා සංවිධාන පිලිබඳ තොරතුරු ඇතුළත් දත්ත මූලාශ්‍රයක් නොතිබීම, එම භාණ්ඩ ලැබුණු බව තහවුරුවන සාක්ෂි ගොනුකර නොතිබීම යනාදී කරුණු හේතුවෙන් මෙම කටයුතු විධිමත් ක්‍රමවේදයකට අනුව සිදු නොවන බව නිරීක්ෂණය විය.

(ඉ) ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත දේශපාලන ශිල්පායතනය වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 03 ක අමාත්‍යාංශ ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද මෙම වැඩසටහන යටතේ අලුතින් පාඨමාලා ආරම්භ කර නොතිබුණු අතර මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබූ මුදලින් රු. මිලියන 2.5 ක මුදලක් වෙනත් වැඩසටහනක් සඳහා මාරුකර තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂවලදී ලබාදුන් ප්‍රතිපාදන ඵලදායී ලෙස යොදවා නොතිබියදී අමාත්‍යවරයාගේ නිර්දේශය මත ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය මගින් නැවතත් "සරුකරමු ගෙවත්ත" වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 30 දින රු. 1,026,000 ක මුදලක් අරමුණු 3 ක් පදනම් කරගෙන සභාවේ මාතර දිස්ත්‍රික් කාර්යාලය වෙත ලබාදී තිබුණි. එහෙත් අපේක්ෂිත පරිදි එම වැඩසටහනද ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සභාවේ ප්‍රධාන ගබඩාවට සමාලෝචිත වර්ෂයේ අගෝස්තු සිට නොවැම්බර් දක්වා අවස්ථා 8 කදී "නිල් බලකාය " ලාංඡනය සහිත ටී ෂර්ට් 15,389 ක් ලැබී තිබුණු අතර විගණන දිනය වූ 2015 ජුනි 16 දින වන විට විවිධ පුද්ගලයන්ට ටී ෂර්ට් 8,888 ක් නිකුත් කර තිබුණි. ඒ අනුව ටී ෂර්ට් 6501 ක තොගයක් බෙදාහැරීමෙන් තොරව ගබඩාවෙහි පැවතුණි. මෙම ටී ෂර්ට් මිලදී ගැනීම පිළිබඳ කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකළ අතර තොග ලැබීම්, නිකුත් කිරීම් ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් නොකර වෙනම ලේඛනයක සටහන් කර තිබුණි. එමෙන්ම භාණ්ඩ සමීක්ෂණ මඟින් ඒ පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී රු. 200,000 ක මුදලක් සභාවේ අරමුණුවලට අදාල නොවන පෞද්ගලික සංවිධානයක මූල්‍ය ශක්තිය වර්ධනය කර ගැනීමේ වේදිකා නාට්‍යයකට අනුග්‍රාහක දායකත්වයක් ලබා දී තිබුණි.

(ඇ) 2015 වර්ෂය සඳහා දිනපොත් 2,000 ක් හා දින දර්ශන 10,000 ක් මුද්‍රණය කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීමෙන්, මිල ඇස්තමේන්තු හා පිරිවිතරයන් සකස් කිරීමෙන් තොරව රු. 4,450,000 ක මිලකට සීමාසහිත තරුණ සේවා සමාගමට ලබාදී තිබුණි. සමාගමට අදාල පහසුකම් නොමැති බැවින් පෞද්ගලික මුද්‍රණ ආයතනයකින් රු. 4,100,000 ක පිරිවැයකට එම කටයුත්ත සිදුකර තිබුණි. ඊට අදාලව නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි වේ.

(i) විගණන දිනය වූ 2015 ජුනි 16 දින වන විට දින පොත් 1751 ක් හා දින දර්ශන 1979 ක් ගබඩාවට ලැබී තිබුණු අතර ඉන් රු. 1,389,750 ක් වටිනා දින පොත් 1635 ක් හා රු. 426,920 ක් වටිනා දින දර්ශන 1642 ක් බෙදා නොහැර ගබඩාකර තිබුණි. එමෙන්ම මෙම තොග ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණි. තවද මැතිවරණ කොමසාරිස්වරයාගේ 2014 දෙසැම්බර් 07 දිනැති හා අංක DE/CE/2/2 දරන චක්‍රලේඛයේ 04 වන ඡේදයට පටහැනිව එම දින දර්ශන හා දින පොත් ජනාධිපතිවරණ අපේක්ෂකයකුගේ දේශපාලන ප්‍රතිරූපය ඉස්මතුවන පරිදි ඔහුගේ පෞද්ගලික ජීවිතය හා දේශපාලන ජීවිතයට අදාල පිංතූර ඇතුළත් කරමින් මුද්‍රණය කර තිබුණි.

(ii) මීට අදාලව ගෙවීමට ඇති රු. 4,450,000 ක වටිනාකමෙහි ඇතුළත් ප්‍රධාන ගබඩාවට සපයා නොතිබූ එකතුව රු. 2,297,110 ක් වටිනා දින පොත් 249 ක් හා දින දර්ශන 8021 ක් ද විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ලෝක තරුණ සමුළුව සඳහා රු. 1,411,200 ක පිරිවැයක් දරමින් වෝකිටෝකි යන්ත්‍ර 30 ක් මිලදීගෙන තිබුණු අතර මීට අදාලව ලංසු විවෘත කරන දිනය වන විටත් සැපයුම්කරුගෙන් භාණ්ඩ සාම්පල් ලබාගෙන එම භාණ්ඩ සුදුසු බව නිර්දේශ කර මිලදී ගැනීමේ ඇණවුම සැපයුම්කරු වෙත යවා තිබුණි.

## 4.5 දෘශ්‍ය අක්‍රමිකතා

(අ) ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් පිළිබඳ උපදේශක සේවා ලබාගැනීම සඳහා පෞද්ගලික උපදේශක සමාගමකට සමාලෝචිත වර්ෂයේදී රු. 4,298,061 ක මුදලක් ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) උක්ත කාර්යයට අදාලව 21 දෙනෙකුගෙන් මිල ගණන් ලැබී තිබුණු අතර 15 දෙනෙකුගේ මිල ගණන් පමණක් ඇගැයීමට ලක්කර තිබූ අතර අනෙකුත් මිල ගණන් නොසලකා හැරීමට වූ හේතූන් විගණනයට ඉදිරිපත් නොවීය.

(ii) ඇගැයීම් නිර්ණායකයන් අනුව ලකුණු 50 ට වඩා ලබාගත් ආයතන දෙක අතුරින් වැඩිම ලකුණු ලබාගත් ආයතනයේ උපදේශක සේවය කොන්ත්‍රාත් පිරිවැයෙන් සියයට 4.98 ට ලබා ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුණි. එහෙත් ආයතනයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ඇතුලු නිලධාරීන් 04 දෙනෙකු සහභාගී වූ කමිටුවක් විසින් මෙම තීරණය නොසලකා ලකුණු 15 ක් පමණක් ලබාගෙන 9 වන ස්ථානයේ පැවති ආයතනයට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. තවද ඉහත සඳහන් තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශය නොපිළිගැනීමට හේතු ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ඉහත සඳහන් පරිදි තෝරාගත් ආයතනයේ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ ව්‍යාපාරය ආරම්භ කළ දිනය 2013 ඔක්තෝබර් 21 දින වූ අතර පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් මෙම සහතිකයට අත්සන යොදා තිබුණේ 2014 අප්‍රේල් 22 දිනය. එහෙත් සභාවේ ඉදිකිරීම් අංශයට මෙම සහතිකය ලැබුණු දිනය 2013 දෙසැම්බර් 18 ලෙස මුද්‍රා තබා තිබුණි.

(ආ) ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ දිරි දීමනා ගෙවීම සඳහා වූ අමාත්‍යාංශ උපදෙස් අනුව, පියවරයන් 05 ක් යටතේ පුහුණු උපදේශකවරුන් ඇගැයීමට ලක්කර ඒ අනුව එක් උපදේශකවරයකු වෙනුවෙන් මාසිකව රු. 8,000 ක දීමනාවක් ගෙවීමට තීරණය කර තිබුණි. එහෙත් සභාව විසින්, අපේක්ෂිත ඉලක්කයන් කරා ළඟාවීමෙන් තොරව දිරි දීමනා ලබාගැනීමට හැකිවන පරිදි එක් එක් නිර්ණායකයේ උපකොටස්වලට වෙන්කර ඇගයීමේ ක්‍රමයක් සකස් කර උපදේශක දීමනා ගෙවා තිබුණි. තවද, මධ්‍යස්ථාන භාර නිලධාරීන්ගේ හා පළාත් අධ්‍යක්ෂවරුන්ගේ දිරිදීමනා ඇගැයීම් පත්‍රිකාද එම නිලධාරීන්ගේ සාමාන්‍ය එදිනෙදා රාජකාරිවලට අයත් කාර්යයන් මත දිරි දීමනා ලබාගැනීමට හැකිවන පරිදි සකස් කර තිබුණි.

(ඇ) "ශ්‍රී ලංකා යූත්" සඟරාවේ කලාප 04 ක් මුද්‍රණය කිරීම සඳහා අනුමත වැඩසටහනක් හෝ ඇස්තමේන්තු ප්‍රතිපාදන නොමැතිව රු. 1,000,000 ක මුදලක් යෞවන සමාජ සම්මේලනය වෙත ලබාදී තිබුණි.

ඒ පිළිබඳව පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන් තොරව හා අවිධිමත් පරිදි තෝරාගත් පෞද්ගලික ආයතනයක් වෙත මෙම සඟරා මුද්‍රණය භාරදී තිබුණි.

(ii) මෙම පෞද්ගලික මුද්‍රණ ආයතනයට පහත සඳහන් පහසුකම් සපයාදීමට ආයතනයේ කළමනාකරණයේ අනුමැතියකින් හා නිසි අධිකාරී බලයකින් තොරව යෞවන සමාජ සම්මේලනයේ ලේකම් විසින් අදාල පෞද්ගලික ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි.

- එක් එක් කලාපය මුද්‍රණය කිරීම සඳහා සභාව විසින් රු. 250,000 බැගින් සෑම මසකම පළමු දින ලබාදීම.
- සඟරා මුද්‍රණයට සම්බන්ධ වන සියළු නිලධාරීන් සඳහා කාර්යාලීය හැඳුනුම්පත් හා Visiting Cards ලබාදීම.
- සඟරාවේ කටයුතු කරගෙන යාම සඳහා කාර්යාලීය ඉඩ පහසුකම් ලබාදීම.
- වාහනයක් සහ ඉන්දන ලබාදීම.
- අමතර අලෙවි ප්‍රවර්ධන සහ මූලාරම්භක ආයෝජනය සභාව විසින් කළ යුතු වීම.

(iii) ගිවිසුමට අනුව සඟරා මුද්‍රණය කිරීමේ හා විකිණීමේ බලතල සමඟ ඒවායෙහි සෝදුපත්ද මුද්‍රණ ආයතනය සතු වූ බැවින් සීමාවකින් තොරව සඟරා මුද්‍රණය කර විකුණා මුදල් ඉපයීමට එම ආයතනයට හැකියාව ලැබී තිබුණි.

(iv) සඟරා තොග ලැබීම් හා නිකුත් කිරීම් පිළිබඳ තොරතුරු සභාවේ ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛනවලට ඇතුළත් කර නොතිබුණු අතර ඒ සඳහා වෙනත් ලේඛනයක් භාවිතා කර තිබුණි. එම තොරතුරුද අවිධිමත් හා අසම්පූර්ණ බව නිරීක්ෂණය විය.

(v) සඟරාවක විකුණුම් මිල රු. 100 ක් ලෙස සටහන් කර තිබීමෙන් විකිණීම සඳහා මුද්‍රණය කරන ලද ඒවා බව නිරීක්ෂණය විය. එහෙත් විකිණීමෙන් කිසිඳු මුදලක් සභාව වෙත ලැබී නොතිබුණු අතර, ඒ සඳහා වූ රු. 1,000,000 ක සම්පූර්ණ පිරිවැය රජයට වැය බරක් වී තිබුණි. එමෙන්ම සඟරාවට ඇතුළත්ව තිබූ වෙළඳ දැන්වීම්වලින් උපයන ලද ආදායම සභාව වෙත ලද බව විගණනයට තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් නොවීය.

## 4.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

විගණනය සඳහා ඉදිරිපත් කළ තොරතුරු අනුව තරුණ සේවා සභාවට අයත් ගොවිපල 14 ට අදාලව මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 294 රූඩ් ¼ ක් විය. ඉන් අක්කර 90 ක් පමණ වගා කටයුතු සඳහා යොදා ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුනි.

## 4.7 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) යොවුන් පාර්ලිමේන්තුව වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය තුළ රු. 46,203,939 ක් වැයකර පාර්ලිමේන්තු සැසිවාර 06 ක් පවත්වා තිබුණු අතර පවත්වන ලද සැසිවාර 06 ක් හා කාරක සභා වැඩමුළුව සඳහා අපේක්ෂිත සහභාගීත්වය 2,884 ක් වුවත් 960 දෙනෙකු (සියයට 33) සහභාගී වී නොතිබුණි. අවිධිමත් මෙන්ම අත්‍යාවශ්‍ය කොන්දේසි ඇතුලත් නොවූ ගිවිසුමකට අනුව සැසිවාර 04 ක් සඳහා පාර්ලිමේන්තු ආකෘතිය සවිකිරීම හා ගලවා ඉවත් කිරීම වෙනුවෙන් අදාල සේවාව නිසි පරිදි ලැබූ බවට සහතිකයකින් තොරව බාහිර ආයතනයක් වෙත, රු. 11,935,062 ක් ගෙවා තිබුණි. අවසන් සැසිවාර 2 සඳහා මෙම කාර්යය තරුණ සේවා සමාගම මඟින් සිදුකර තිබුණු අතර ඒ සඳහා රු. 3,468,400 ක් ගෙවා තිබුණි. ඒ අනුව, බාහිර ආයතනයක් හා සීමාසහිත තරුණ සේවා සමාගමට එක් සැසිවාරයක ගෙවීම්වල සාමාන්‍යය පිළිවෙළින් රු. 2,983,765 ක් හා රු.1,734,200 ක් විය. ඒ අනුව සැසිවාරයකට රු. 1,249,565 ක් බැගින් සැසිවාර 4 ක් සඳහා රු. 4,998,260 ක මුදලක් වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(ආ) 2011 වර්ෂයේ සිට ක්‍රියාත්මකව පවතින ශ්‍රී ලංකා යූත් නිවාස ව්‍යාපෘතියෙහි ප්‍රගතිය පිළිබඳ වීඩියෝ පටයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 වගන්තියට පටහැනිව වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරමින් තෝරාගත් පෞද්ගලික ආයතනයකට රු. 930,000 ක මුදලක් හා අමතර පහසුකම් සැපයීම වෙනුවෙන් රු. 16,800 ක් ගෙවා තිබුණි. කාර්ය මණ්ඩලය 13 කින් සමන්විත සභාවේ නිස්කෝ වීඩියෝ අංශය මඟින් මෙම කටයුත්ත සිදුකළ හැකිව තිබුණත් එම අංශයේ පවතින පහසුකම් ප්‍රමාණවත් නොවන බවට හේතු දක්වමින් පෞද්ගලික ආයතනයක් මඟින් සිදුකර තිබුණි. එහෙත් 2013 හා 2014 වර්ෂවලදී ඇස්තමේන්තු ප්‍රතිපාදන මඟින් නිස්කෝ වීඩියෝ අංශයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් එකතුව රු. 44,625,000 ක් වෙන්කර දී තිබුණත් එහි සංවර්ධන කටයුතු සිදුකර තිබූ බවට සාක්ෂි නොවීය.

(ඇ) "ශ්‍රී ලංකා යූත් සිහිනය" වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු. 17,261,766 ක ප්‍රතිපාදන සලසා තිබුණු නමුත් ඒ සඳහා වැයකර තිබුණේ රු. 7,841,251 ක් පමණි. මෙම වැඩසටහන වට දෙකක් යටතේ ක්‍රියාත්මක වූ අතර පළමු හා දෙවන වට සඳහා පිළිවෙලින් තරඟකරුවන් 36 ක් හා 30 ක් සහභාගී වී තිබුණි. අවසන් තරඟකරුවන් සඳහා ත්‍යාග ලබාදීම වෙනුවෙන් රු. 2,400,000 ක මුදලක්ද, සිහිනය "රියැලිටි ෂෝ වැඩසටහනේ ජයග්‍රාහකයින්ගේ ගීත ඇතුළත් සංයුක්ත තැටි 2 ක පිටපත් නිර්මාණය කිරීම සඳහා රු. 1,200,000 ක ප්‍රතිපාදනද වෙන්කර තිබුණ නමුත් එම කටයුතු සිදුකර නොතිබුණි.

(ඈ) ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ වූ ප්‍රතිපාදන හා ඉලක්කයන් අනුව සමාලෝචිත වර්ෂයේදී රත්මලාන පුහුණු මධ්‍යස්ථානයේ වැඩි දියුණු කිරීම් නිම කළයුතුව තිබුණි. එහෙත් එම ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීම වෙනුවට කඩා ඉවත් කර නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමටත්, රු. 7,024,500 ක වාර්ෂික බදු කුලියක් ගෙවීමේ පදනම මත එම පුහුණු මධ්‍යස්ථානය සඳහා බාහිර ගොඩනැගිල්ලක් කුලියට ගැනීමටත් කළමනාකරණය තීරණය කර තිබුණි. අවිධිමත් පරිදි ලබාගත් කුලී ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීමට එකතුව රු. 4,959,594 ක් විගණිත දිනය වූ 2015 ජුනි 25 වන විට වැය කර තිබුණි. බදු කාලය 2015 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වුවද අවශ්‍ය ප්‍රතිපාදන නොමැති බැවින් මධ්‍යස්ථානයේ

ඉදිකිරීම අවසන්වීමේ අවිනිශ්චිතභාවයක් නිරීක්ෂණය වූ අතර අමාත්‍යාංශ අනුමැතියකින් තොරව මෙම කටයුත්ත සිදුකර තිබූ බැවින් උක්ත වියදම් ආංශික නිපුණතා සංවර්ධන වැඩ සටහන යටතේද ප්‍රතිපූර්ණය කළ නොහැකිවී තිබුණි.

(ඉ) සභාව විසින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී වේදිකා සැකසීම, වේදිකා සැරසිලි සහ ශබ්ද විකාශන පද්ධති සැපයීම සඳහා රු. 24,092,029 ක් වැය කර තිබුණු අතර පහත සඳහන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නියමයන්ට පටහැනිව කටයුතු කර තිබුණි.

| **මාර්ගෝපදේශයට යොමුව** | **කඩ කිරීම** |
|---|---|
| මාර්ගෝපදේශ 2.3 (අ) | පිරිවිතර කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව ප්‍රසම්පාදන ලේඛන පිළියෙළ කර නොතිබුණි. |
| මාර්ගෝපදේශ 6.3.6 | ලංසු ලේඛන විවෘත කිරීමේ කමිටු වාර්තා තබාගෙන නොතිබුණි. |
| මාර්ගෝපදේශ 5.6 /4.3.1 | පිරිවිතර සකස් කර නොතිබුණු අතර මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි. |
| මාර්ගෝපදේශ 2.11.3 | නිර්දේශිත ආකෘතිය ප්‍රකාරව තීරණය පැහැදිලිව දක්වමින් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව සකස් කර නොතිබුණි. |
| මාර්ගෝපදේශ 8.9.3 | රු. 2,633,970 ක් පිරිවැය වූ කොන්ත්‍රාත්තුවට අදාලව විධිමත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. |
| මාර්ගෝපදේශ 5.4.7 | අත්තිකාරම් ඇප සුරක්ෂණයක් තබාගෙන නොතිබුණි. |
| මාර්ගෝපදේශ 5.4.8 | කාර්යසාධන ඇප සුරක්ෂණයක් තබාගෙන නොතිබුණි. |

උක්ත වියදම්වල ඇතුලත් වූ රු. 2,633,970 ක පිරිවැය වූ කොන්ත්‍රාත්තුවට අදාල ලංසු කැඳවීම 2014 පෙබරවාරි 11 දින සිදුකර ප්‍රසම්පාදන කමිටු තීරණය එදිනම ලබාදී පසුදින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ දිනයක් සඳහන්ව නොතිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඊ) සීමාසහිත තරුණ සේවා සමාගමේ කොටස් ආයෝජනය වෙනුවෙන් 1985 වර්ෂයේ එකතුව රු.4,032,360 ක මුදලක් සභාව විසින් වැයකර තිබුණත් එම ආයෝජනය වෙනුවෙන් කිසිදු ප්‍රතිලාභයක් සමාලෝචිත වර්ෂයේදී ලැබී නොතිබුණි.

## 4.8 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ගබඩාවේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව වර්ෂ 25 ක කාලයක සිට පැවත එන එකතුව රු. 2,646,404 ක වටිනාකම වූ භාණ්ඩ 405 ක ඌනතාවයක් පවතින අතර එම භාණ්ඩවලින් 71 ක් සමාලෝචිත වර්ෂයේ මිලදීගත් ඒවා විය. එම ඌනතාවයන් පිළිබඳ විධිමත් පරීක්ෂණ සිදුකර අලාභ අයකිරීම කෙරෙහි ආයතනයේ අවධානය යොමුවී නොතිබුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ දී අනාවරණය වූ භාණ්ඩ ඌනතාවයේ වටිනාකම රු.212,920 ක් පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව පෙර වර්ෂයේ ආදායම් වියදම් ගිණුම් ශේෂයට කපාහැර තිබුණි.

## 4.9 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුරාධපුරය යොවුන් මධ්‍යස්ථානයේ ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් පිළිබඳ කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම රු. 6,075,740 ක් වූ අතර රු. 7,276,890 ක මුදලකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මෙම කොන්ත්‍රාත්තුව 2011 නොවැම්බර් 05 දින ආරම්භ කර 2012 පෙබරවාරි 02 දින නිමකල යුතුව තිබුණි. එහෙත් නියමිත දිනට කොන්ත්‍රාත්තුව නිමකර නොතිබුණු අතර 2013 අගෝස්තු 20 දින ඉතිරි වැඩ හා අඩුපාඩු තිබියදී ගොඩනැගිල්ල භාරගෙන තිබුණි. 2014 පෙබරවාරි 18 දින දක්වා ඉතිරි වැඩ නිමකර නොතිබුණු බව උපදේශක සමාගම දන්වා තිබුණි. තවද නිමකර භාර දෙන ලද ගොඩනැගිල්ලෙහි මූලික අඩුපාඩු ද ඇතුළුව අඩුපාඩු 25 ක් පැවති බව මධ්‍යස්ථාන භාර නිලධාරී විසින්ද ආයතනයට දන්වා තිබුණි.

ඊට අදාලව තවදුරටත් නිරීක්ෂණය වූ කරුණු පහත සඳහන් වේ.

(i) අතිරේක වැඩ සඳහා රු. 4,950,980 ක ඇස්තමේන්තුවක් ඉංජිනේරු උපදේශක සමාගම විසින් පිළියෙල කර තිබුණද ඒ සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාදී නොතිබුණි. එහෙත් අවසන් බිල්පතට අනුව කොන්ත්‍රාත්තුවේ මුලු වටිනාකම රු.11,677,341 ක් වී තිබුණු අතර එය ගිවිසුම්ගත වටිනාකමට වඩා රු.4,400,451 ක් හෙවත් සියයට 60.47 කින් වැඩිවීමකි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 වගන්තිය ප්‍රකාරව සියයට 10 ට වඩා ගිවිසුම් ගත මුදලෙන් විචල්‍යතා ඇතිවන විට මුලු පිරිවැය ඇස්තමේන්තුව සංශෝධනය කළ යුතුවුවත් එසේ කර නොතිබුණු අතරම 2014 දෙසැම්බර් 24 දින පැවැත්වූ ප්‍රසම්පාදන කමිටු රැස්වීමේදී උපදේශක විසින් නිසි පරිදි සහතික නොකරන ලද අවසන් බිල්පත ගෙවීමටත්, ප්‍රමාදය නොසලකා කොන්ත්‍රාත් කාලය වර්ෂ 1 ½ කින් දීර්ඝ කිරීමටත් තීරණය කර තිබුණි.

(ii) විගණන දිනය වූ 2015 පෙබරවාරි 27 දින වන විටත් කොන්ත්‍රාත්තුව නිමකර විධිමත් පරිදි භාරදී නොතිබුණු අතර ගිවිසුම් ගත දිනට වඩා කොන්ත්‍රාත් කාලය වසර 03 ක් ගතවී තිබුණත් ප්‍රමාද ගාස්තු අයකිරීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

(ආ) අනුරාධපුර යොවුන් නිකේතනයේ තරුණ සම්මේලන කාර්යාලය නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව 2011 ඔක්තෝබර් 14 දින රු. 8,089,950 කට පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයකට පිරිනමා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) උපදේශකගේ ලංසු ඇගයීම් වාර්තාවට අනුව හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව පිළිගත නොහැකි ලංසු ඇපකරයක් ඉදිරිපත් කිරීම මත මෙම කොන්ත්‍රාත්කරු නුසුදුසු කෙනෙකු බවට තීරණය කර තිබුණද කොන්ත්‍රාත්තුව ඉහත ආයතනයට පවරා තිබුණි.

(ii) අවසන් බිල්පතට අනුව මුළු කොන්ත්‍රාත් වටිනාකම ගිවිසුම්ගත වටිනාකමට වඩා සියයට 57 ක් වැඩිවී තිබුණත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 ඡේදය ප්‍රකාරව මුලු පිරිවැය ඇස්තමේන්තුව සංශෝධනය කර නොතිබුණි. එමෙන්ම අමතර වැඩ සඳහා රු. 3,960,131 ක් බිල්පත්වල ඇතුළත් කර තිබුණු අතර එය මුළු පිරිවැය ඇස්තමේන්තුවෙන් සියයට 49.4 කි. මේ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය හෝ ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය ලබාදී නොතිබුණි.

(iii) ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුව නිමකල යුතු දිනය 2012 පෙබරවාරි 02 වුවත් නිමකර භාරදී තිබුණේ 2014 පෙබරවාරි 18 දින දීය. එහෙත් ප්‍රමාද ගාස්තු අය කිරීමට හා අසාමාන්‍ය ලෙස කොන්ත්‍රාත්තුව ප්‍රමාද කිරීම පිළිබදව කොන්ත්‍රාත්කරුට එරෙහිව

කටයුතු කර නොතිබුණු අතර මුල් කොන්ත්‍රාත් වටිනාකම හා අමතර වැඩ ඇතුළත් මුලු මුදල ගෙවීමට ප්‍රසම්පාදන කමිටුව පසුව අනුමත කර තිබුණි.

(iv) මෙම කොන්ත්‍රාත් කාර්යයට අදාලව උපදේශක සමාගම විසින් වැඩබිමෙහි සිට නිසි අධීක්ෂණයක් සිදුකර ඇති බව තහවුරු වන සාක්ෂි නොතිබුණි.

(ඇ) සභාවට අයත් ලව්ලේන් පුහුණු මධ්‍යස්ථානය නවීකරණය සඳහා රු. මිලියන 25 ක් ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ වෙන්කර තිබුණු අතර ඉංජිනේරු ඇස්තමේන්තුව රු. 23,803,980 ක් වී තිබුණි. මිල ගණන් ඇගයීමේදී උපදේශක ආයතනය හා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් 04 වන අඩුම මිල ඉදිරිපත් කළ ආයතනය නිර්දේශ කර තිබුණු අතර ප්‍රසම්පාදන කමිටු තීරණය ගොනුගත කර නොතිබුණි. තවද, රු. 19,558,550 ක් වූ එම මිල ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 17.83 කින් අඩුවී තිබුණු අතර එසේ තෝරාගැනීමට අදාල සවිස්තර වාර්තා ගොනුකර නොතිබුණි.

## 4.10 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සංවර්ධන සැලැස්මට අනුව යූත් නිවාස වැඩසටහන සඳහා රු.46,123,200 ක ප්‍රතිපාදන වෙන්කර තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල නිවාස ගැටළුවලට මුහුණ දී සිටින තරුණ තරුණියන් 246 කට යෞවන සමාජ ප්‍රාදේශීය මණ්ඩලයේ මෙහෙයවීමෙන් හා ප්‍රදේශයේ ව්‍යාපාරික ප්‍රජාවගේ අනුග්‍රහය මත නිවසක් ඉදිකිරීමටත්, නිවසක් ඉදිනොකරන යෞවන සමාජ ප්‍රාදේශීය මණ්ඩලය සඳහා සම්පත් මධ්‍යස්ථානයක් ඉදිකිරීමටත් සැලසුම් කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී එකම නිවාසයක්වත් ඉදිකර නොතිබුණු අතර මෙම වැඩසටහන විධිමත් පරිදි සැලසුම් කර ක්‍රියාත්මක නොකිරීම මත උතුරු නැගෙනහිර ප්‍රදේශවල නිවාස ඉදිකිරීම සඳහා ලැබීමට තිබූ විදේශාධාර ලබාගැනීමට නොහැකි වී තිබුණි. එමෙන්ම පෙර වර්ෂයේ මෙම වැඩසටහන යටතේ ජාතික මට්ටමේ හොඳම නිවාසය තේරීමේ තරඟයක් පවත්වා තිබුණු අතර ගම්පහ දිස්ත්‍රික්කයේ පළමු ස්ථාන දිනාගත් නිවාස වෙනුවෙන් අදාල යෞවන සමාජයට රු.40,000 ක්, යෞවන සමාජ ප්‍රාදේශීය සම්මේලනයට රු. 20,000 ක් සහ තරුණ සේවා නිලධාරීතුමාට රු.25,000 ක් ලෙස එකතුව රු.85,000 ක් ලබාදීමට තීරණය කර තිබුණද එම ත්‍යාග මුදල් සමාලෝචිත වර්ෂය නිමවන විටත් ලබාදී නොතිබුණි.

(ආ) රජයට වැය බරක් නොවී වැඩි තරුණ පිරිසකට උසස් අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සැලසීම පිණිස ආරම්භ කරන ලද තරුණ සරසවිය වැඩසටහන සමාලෝචිත වර්ෂය වන විට සභාවට වැය බරක් වෙමින් අඩපන වන තත්ත්වයට පැමිණ තිබුණු බව 2010 වර්ෂය හා සමාලෝචිත වර්ෂයේ තොරතුරු සැසඳීමේදී නිරීක්ෂණය වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව 2010 වර්ෂයේ ඒ යටතේ රු.8,631,236 ක ලාභයක් ලැබී තිබුණත් සමාලෝචිත වර්ෂයේ ආදායම ඉක්මවා රු.4,291,840 ක වියදමක් පෙන්නුම් කෙරුණි. තවද, 2010 වසරේදී දිස්ත්‍රික්ක 15 ක ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන සමාලෝචිත වර්ෂයේදී කොළඹ දිස්ත්‍රික්කයට පමණක් සීමාවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ජාතික තරුණ ප්‍රතිපත්තිය එළිදැක්වීමේ වැඩසටහන සඳහා රු. මිලියන 14 ක පමණ පිරිවැයක් දරා තිබුණි. එහෙත් එම ප්‍රතිපත්තිය සකස් කිරීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා නීත්‍යානුකූල පදනමක් සකස් කරගැනීමට විගණන දිනය වූ 2015 ජුනි 30 වන විටත් නොහැකිවී තිබුණි.

## 4.11 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාවේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී තනතුරු ඇතුළුව මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු 25 ක නිලධාරී පුරප්පාඩු පැවති අතර එම තනතුරු සඳහා වැඩ ආවරණය කිරීමේ පදනම මත ඊට පහළ ශ්‍රේණිවල නිලධාරීන් හා බාහිරින් බඳවාගත් නිලධාරීන් 15 දෙනෙකු සේවයේ නියුක්ත කර තිබුණි. කෙසේ වුවද අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිලධාරීන් 189 දෙනෙකු සේවයේ නියුක්ත කර තිබුණි.

(ආ) කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 මැයි 09 දිනැති අංක DMS/E3/36/04/224/1-1 දරන ලිපිය මඟින් සභාව සඳහා අනුමත නොවූ තනතුරු 11 සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිලධාරීන් 152 ක් සේවයේ නියුක්ත කර තිබුණි.

(ඇ) සභාවට අයත් ගොවිපල 6 ට අදාල මධ්‍යස්ථාන භාර නිලධාරීන් කෘෂිකර්ම ක්ෂේත්‍රය සම්බන්ධ නිපුණතාවයකින් යුතු නිලධාරීන් නොවන බව නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

## 5.1 අභ්‍යන්තර විගණනය

-------------------------

කාර්ය මණ්ඩලය 09 කින් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ සභාවෙහි මූල්‍ය හා මෙහෙයුම් කටයුතුද, ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ වූ විශේෂ වැඩසටහන්ද විධිමත් පරිදි ඇගයීමට හැකිවන පරිදි විගණන වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා සමස්ත අයවැය ප්‍රතිපාදන රු.මිලියන 1,587 ක් වූ අතර වියදම රු.මිලියන 1,626 ක් වීමෙන් ප්‍රතිපාදන ඉක්මවා රු. මිලියන 39 ක් වැයකර තිබුණි. තවද අංශ 06 ක් සඳහා වූ එකතුව රු. 1,006,671,000 ක ප්‍රතිපාදන ඉක්මවා රු. 268,671,476 ක් වැයකර තිබුණි. එමෙන්ම ආයතනයේ අරමුණු ඉටු කිරීම කෙරෙහි ඍජු දායකත්වයක් දක්වන වැඩසටහන් වෙනුවෙන් අංශ 10 ක් සඳහා වෙන්කළ එකතුව රු. 432,669,000 ක ප්‍රතිපාදනවලින් සියයට 54 ක් අදාල අරමුණු කරා යෙදවීමෙන් තොරව ඉතිරිව තිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

----------------------------------

පසුගිය විගණන වාර්තාවලින් පෙන්වා දුන් පහත සඳහන් අඩුපාඩු නිවැරදි කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

(අ) ආයතනය විසින් පරිහරණය කරමින් පැවති වාහන 15 ක් ඉවත්කර ආයතනයේ පුහුණු වැඩසටහන් සඳහා පුහුණු උපකරණ ලෙස යොදාගෙන තිබුණු අතර වාහන ඉවත් කිරීමෙන් වූ ලාභය හෝ පාඩුව මෙන්ම පුහුණු වැඩසටහන් සඳහා යොදාගත් වාහනවල වටිනාකම ගිණුම් පොත්වලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) බේරුවල තරුණ මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් 2000 ජූලි සිට බල පැවැත්වෙන පරිදි අවුරුදු 50 ක බදු කාල සීමාවකට නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගත් පිරිවැය

රු.3,398,200 ක් වූ ඉඩම සමාලෝචිත වර්ෂය නිමවන විටත් අරමුණුගත කාර්යයෙහි නොයොදවා නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) "සරු කරමු" ගෙවත්ත ව්‍යාපෘතිය සඳහා 2009 වර්ෂයේ විදේශාධාර වැඩසටහනක් මඟින් රු.1,143,155 ක මුදලක් සභාව වෙත ලබාදී තිබුණු අතර එම මුදල 2011 වර්ෂයේදී ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය වෙත ලබාදී තිබුණත් වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. එසේ තිබියදී එම මුදල ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ තැන්පත් කර ඇති බවත්, සැලසුම්ගත පරිදි වැඩසටහන පවත්වමින් පවතින බවටත්, සාවද්‍ය තොරතුරු 2013 දෙසැම්බර් 03 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කර තිබුණි. අදාල කාර්යය නිසි පරිදි ඉටු නොකිරීම සම්බන්ධව සම්මේලනයට විරුද්ධව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ප්‍රසම්පාදනය

(ආ) අයවැය පාලනය

(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය